මුතු කරාඹුව

මැරුණු ළමයගේ නම අයින් කළා

පාන් ගන්න ඔහු ටොරින්ටන් ගියා
පරිපාලනයේ කැන්ටිමේ

ඔළු ගෙඩි දෙතුන්සීයක් ඉස්සරහා කළුවරේ අජිත් කුමාරසිරි සහ ගිටාරය පුපුරා ගියා.

ඒ හඬ නැසුණු කෝටි කීපයක් ජෝන් ද සිල්වා එකෙන් එළියෙ ලංකාව කියන රටේ ඉන්නවා. උන්ගෙ කන් බයිපාස් කරන්නෙ කවදද?

කිසිම දවසක තරුවක් නොවෙන,

සුරංගනාවිය ගඟ අයිනට ආවා
ඔරුව අරන් මම හරි මැදටම ආවා
සඳේ සා පැටවු ගඟ ළඟ ඇහැලෑවා
ගඟ අයිනෙම ඇය ඇගේ සළුව පෑවා

සුරංගනාවියෙ මෙහේ ඉන්න හොඳ නෑ
පාර්ලිමේන්තුවත් ඉස්සර වාගේ නෑ
මිනී මරණ අය ජීවිත අඳුරන්නෑ
ජීවිතවල රස කොහොමත් උන් දන්නෑ

ප්‍රසංගයේ තේමාව වුනේ "උතුර සුන්දරද බබා". කියපු සිංදු පහළොවෙන්

# ආණ්ඩුව ඇවිත් අපෙ ඇඳ උඩටම බබා




මේ කල් ඉකුත් සටහනකි. 2007 ජූලි මාසයේ 20 වෙනිදා බයි-පාස් වීමෙන් පසු පහුවදා පාන්දරම (සැබෑ ගායකයෙකු) සොයන්නාට (එම ගායකයාව) සම්බවීමේ ප්‍රහර්ෂයෙන් යුතුව ලියූ සටහනකි.

**බයි-පාස් වුනෙමි**

ඊයේ - ජූලි 20 රෑ 7 ට ජෝන් ද සිල්වාහිදී බයි-පාස් වුනෙමි.
අහසේ තරු තිබුණද මතක නැහැ.
ඇස් දෙක පියාගෙන අජිත්ව අහගෙන ඉන්දැද්දි ජෝන් ද සිල්වා වහලයේ ආදරය, වෛරය, යුද්ධය, ළමයි, අම්මලා, මවුකිරි, ලේ, කඳුළු සහ තවත් අමුතු දේවල් සිත්තමක් වාගෙ ඇඳුනා.

හමුදා හටයට මලක් පෑගුණා
බෝම්බෙකට පොඩි ළමෙක් අහුවුණා
හෘද සාක්ෂිය වතුරෙ ගියා
ගාලු මෝදර බේසමෙන්

පොඩි ළමයෙක් හඬ හඬා හිනැහුණා
රතු පාටින් ඒ සිරුර දිලිසුණා
ෆුල්කිට් ගහගෙන හුඟක් රැස්වුණා

පාන් ගන්න ඔහු ටොරින්ටන් ගියා
පරිපාලනයේ කැන්ටිමේ

පාසල් වාරය තව අළුත් වුණා
ළමයි පේළියේ හිඩසක් හැදුණා
අළුත් ළමයෙක් හිඩස පිරෙවුවා

***ඔළු ගෙඩි දෙතුන්සීයක් ඉස්සරහා කළුවරේ අජිත් කුමාරසිරි සහ ගිටාරය පුපුරා ගියා.***
***ඒ හඬ නැසුණු කෝටි කීපයක් ජෝන් ද සිල්වා එකෙන් එළියෙ ලංකාව කියන රටේ ඉන්නවා. උන්ගෙ කන් බයිපාස් කරන්නෙ කවදද?***
***කිසිම දවසක තරුවක් නොවෙන, කිසිම දවසක සති අග ටී.වී. චාර්ට් ෂෝ එකකට වැද්ද නොගන්න, සල්ලි බවට පත් කළ නොහැකි පෙනුමක් තියන එක මිනිහෙක්...***

කිසිම දවසක සති අග ටී.වී. චාර්ට් ෂෝ එකකට වැද්ද නොගන්න, සල්ලි බවට පත් කළ නොහැකි පෙනුමක් තියන එක මිනිහෙක්...

ආතල් එකකුත් නැති, කිචි කැවෙන්නෙත් නැති, ෆනුත් නැති- ත්‍රිලුත් නැති, මාරෙට සුන්දරත් නැති වොයිස් එකක්...

කම්බි කැඩෙයි කියලා සත පහකට බය නැතුව කෑ ගහන ගිටාර් එකක්....

මං දන්නෙ නෑ. මට තේරෙන්නෙ නෑ. ඊගාවට අජිත් කරන දේ.

අජිත් බයිපාස් එකට යොදා ගත් සැත්කම් පිහිය කටහඬ. ඒක හරි මාරයි. ඇතැම් ගීයක අරුත් වෙඩි තියනවා වගේ. වෙඩි වදින්න ඕනෙ එවුන්ට ඇහෙන්න මේවා කියන්න ඕනෙ.

බොහොමයක් යුද්ධය සම්බන්ධ ප්‍රකාශන. අනෙක්වා ආදරය පිළිබඳ වෙනස් කියවීම්. යුද මිහිරෙන් පිස්සු පීකුදු වෙච්චි රටක, ඔක්කොමල්ලා දොයිය බබා කරන වෙලාවක- සිංහල රොක් කියන අජිත් කුමාරසිරිගෙ වැඩේ එක්තරා විදිහක ගරිල්ලා ප්‍රහාරයක් වගෙයි.

තරංග ජයසේන
www.boondi.lk

<u>වලිග සටහන-</u>

වසර දෙකකට පස්සෙ "ආණ්ඩුව ඇඳ උඩටම ඇවිත් කකුල තියලා බඩට ගොඩ වුනු" සන්දර්භයක් ඇතුළේ, හැම තැනම ජේන - හැම තැනම ඇහෙන අජිත් කුමාරසිරි කෙනෙක් ගැන හීනය බරපතල ගොං-පාට් එකක් බව මේ වෙද්දි මටම පැහැදිලියි. හේතුව අජිත්ගේම වචන වලින් කියනවා නම් මෙන්න මේ වගේ.

"මාධ්‍ය මගින් ගොඩනගල තියන ලාංකීය සමාජය තුළින් මාව (මම කරන වැඩ) තවම එළියට ඇවිත් නෑ. ඒකට හේතු මාධ්‍ය තුළින් මවන රොමැන්ටික් ප්‍රමිතීන් හා සදාචාරය වැනි මිනුම් දඬු නිසා. ඉතිං රොමැන්ටිකව වට්ටෝරු ගත කරලා තියන ලංකාවෙ මාධ්‍ය තුළින් මාව අහන්න අමාරුයි."

## බ්ලොග් කතන්දර

### සුද්ද ට පාර කියපු හැටි

මේකත් ටිකක් පරණ කතාවක්. මං ඇඩ්වාන්ස් ලෙවල් කරන කාලෙ වෙච්ච සිද්ධියක්.

මං එදා ගොඩගේ පොත් සාප්පුව පැත්තෙ ඉඳල මරදාන ස්ටේෂන් එක දිහාවට ඇවිදගෙන යනව. මෙන්න බොලේ සුද්දෙක්, ටුවරිස්ට් කෙනෙක්, මට කතා කලා.

මිනිහ ඇහෙව්වෙ "මං ටවුන් හෝල් එකට යන්නෙ කොහොමද?" වගෙ සරල ප්‍රශ්නයක්. මගෙ තරම ගැන හිතල ද කොහෙද ඉතාමත් හෙමින්, පැහැදිලිව කතා කරපු හින්ද ද කොහෙද මට හොඳට තේරුණා අහපු දේ.

මරදානෙ ඉඳල ටවුන් හෝල් එකට යන හැටි නොදන්නෙ කවුද? ඒත් ඉතිං, කොහොමද ඕක මං ඉංගිරිසියෙන් කියන්නෙ.

මගෙ කටට ආවෙ එකම උත්තරයයි.

අයි ඩෝන්ට් නෝ٫

සුද්ද කට ඇඹුල් කරගෙන යන්න ගියා.

ඉතිං මෙතන ප්‍රශ්නෙ මෙන්න මේකයි. මං ඒ දවස්වල ඉස්කෝලෙ දි ඉංගිරිසි ඉගෙන ගත්තට, පන්තියෙ දි තියා වෙන කොහේදිවත්, කා එක්ක වත් ඉංගිරිසියෙන් කතා කරල නෑනෙ.

ඇත්තටම කියනව නං, මට සාමාන්‍ය පෙල ඉංගිරිසි වලට ඩිෂ්ටිංෂන් එකක් තිබුන. අපේ පන්තියෙ හිටපු අනිත් කොල්ලො සේරම ෆේල්. එක කෙල්ලෙකුට ක්‍රෙඩිට් එකක් තිබුන. තව දෙන්නෙක් පාස්. අනිත් උනුත් හැමෝම ෆේල්.

අපේ පන්තියෙ එකම ඩිෂ්ටිංෂන් එක ගත්තු එකාටත් කියන්න පුළුවන් උනේ "අයි ඩෝන්ට් නෝ" කියල විතර නම් ඒ ඉංගිරිසි ඉගෙනීමෙ ඇති වැඩේ මොකක්ද?

ඇඩ්වාන්ස් ලෙවල් කරල රිසල්ට් එනකං ඉන්න කාලෙ ලාල් සර් ගෙ "ස්පෝකන් ඉංග්ලිෂ්" පන්තියට ගියාට පස්සෙ තමයි පොඩ්ඩක් හරි ඉංගිරිසියෙන් කතා කරන්න ගටක් ආවෙ.

අවුරුදු දෙකකට විතර පස්සෙ ඉංගිරිසියෙන් කතා නොකර බැරි තැනකට වැටුණු වෙලේ, ඒ ගට හින්දයි ජාම් බේරගත්තෙ.

අයි ඩෝන්ට් නෝ මෙලෝ දෙයක් සිංහලෙන් නං ඕනෑ දෙයක්

කතන්දරකාරයා
http://kathandara.blogspot.com/